# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 54 දරන
# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගශාලා මණ්ඩල පනත

---

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 දෙසැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලට දී ලබාගත හැකිය

මිල : ශත 80 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 3/82.

**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය නමින් මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ කළමනාකරණය සහ පරිපාලනය එකී මණ්ඩලයට පැවරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින් මතු "ආරෝග්‍යශාලාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ කටයුතු කළමනාකරණය කිරීමේ හා පරිපාලනය කිරීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටුවීම.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් එයට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) මණ්ඩලය, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:— මණ්ඩලයේ සංයුතිය.

(අ) (මෙහි මින් මතු "පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අට දෙනෙක්; එනම්—

(i) මණ්ඩලයේ සභාපතිවරයා;

(ii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි නියෝජිතයෙක්;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්;

(iv) ආරෝග්‍යශාලාවේ උපදේශක කාර්ය මණ්ඩලය විසින් සිය සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගනු ලබන තැනැත්තන් තිදෙනෙක්;

(v) සිය වෘත්තියේ ලා විශිෂ්ඨ සේවාවක් කර ඇති තැනැත්තන් අතුරින් තෝරාගනු ලබන තැනැත්තන් දෙදෙනෙක්; සහ

2— ඒ 073977 — 7,550 (83/12)

(ආ) නිල බලයෙන් සාමාජිකයන් වන්නා වූ තිදෙනෙක්; එනම්—

(i) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා;

(ii) පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා; සහ

(iii) ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂවරයා.

(2) (i) නිල බලයෙන් මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තකු ම, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබුවේ කවර ධුරයක් දැරීම හේතුකොට ගෙන ද එකී ධුරය දරන්නාක් කල් මණ්ඩලයේ සාමාජිකත්වය දැරිය යුතු ය.

(ii) සභාපතිවරයා සහ පත් කරන ලද සෑම සාමාජිකයකු ම සිය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර සිය ධුර කාලය අවසානයේ දී නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(3) මණ්ඩලයේ සභාපතිවරයා විසින් හෝ පත් කරන ලද යම් සාමාජිකයකු විසින් ධුරය දැරීම අත් හරින ලද අවස්ථාවක දී එසේ ධුරය අත් හරින ලද සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය තුළ දී ධුරය දැරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) අසනීපවීම හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට හෝ පත් කරන ලද යම් සාමාජිකයකුට හෝ තාවකාලිකව නොහැකි වුව හොත්, සභාපතිවරයා හෝ එකී අනෙක් සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ සභාපතිවරයාට හෝ පත් කරන ලද යම් සාමාජිකයකුට කවර වූ හෝ අවස්ථාවක අමාත්‍යවරයා වෙත ඒ සඳහා යවනු ලබන ලිපියක් මඟින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) පත් කරන ලද යම් සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතුවක් නොදක්වාම ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර එකී ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ අවසරය කලින් ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන මණ්ඩලයේ පත් කරන ලද යම් සාමාජිකයකු ඒ නයින් ම සිය ධුරය අත්හැර ගිය ලෙස සැලකිය යුතු ය.

(8) මේ පනතේ යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර සිය ධුරය අත් හරින, මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

4. අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන යම් ආකාරයක හා ප්‍රමාණයක පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන් ගේ පාරිශ්‍රමික.

5. (1) මණ්ඩලයේ රැස්වීම් මාසයකට එක් වරක් හෝ පවත්වනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය මණ්ඩලයේ සභාපතිවරයා විසින් දැරිය යුතු අතර ඔහු පැමිණ නොමැති අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුණ ද එය නොතකා මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය.

6. මණ්ඩලයේ මුද්‍රාව— මණ්ඩලයේ මුද්‍රාව.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) මණ්ඩලයේ අනුමතය සහිතව සහ, තමන් පැමිණ සිටි බවට සාධකයක් වශයෙන් යම් ලියවිල්ලක් අත්සන් කළ යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, එම ලියවිල්ලට තබනු නොලැබිය යුතු ය.

7. (1) ආරෝග්‍යශාලාවේ කටයුතු කළමනාකරණයට හා පරිපාලනයට අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික විය හැකි සියලු දේ කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය. මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම කරනු ලැබිය හැකි ය:—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වශයෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) මේ පනත යටතේ හෝ යම් මිළ දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් හිමිවීමක් හෝ වෙනත් ආකාරයකින් මණ්ඩලය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හෝ දැරීම සහ ආරෝග්‍යශාලාව හැරුණු කොට වෙනත් කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, පැවරීම, සමර්පනය කිරීම, රික්ථවරණය කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ, සේවකයන් පත් කිරීම, උසස් කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම, නිවාඩු දීම හා අනෙකුත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම පිළිබඳ රීති සෑදීම ;

(ඈ) 10 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මණ්ඩලයේ අරමුදල පරිපාලනය කිරීම ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ එකතු කිරීම ; සහ

(ඊ) මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

කළමනාකරණ කමිටුව.

8. (1) ආරෝග්‍යශාලාවේ දෛනික කටයුතු පරිපාලනය කිරීම සඳහා මණ්ඩලය විසින් කළමනාකරණ කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මණ්ඩලයේ බලතල කාර්ය සහ කර්තව්‍ය, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කළමනාකරණ කමිටුව වෙත, මණ්ඩලය විසින් කලින් කල පවරා දෙනු ලැබිය හැකි ය.

(3) කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(i) ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂවරයා ;

(ii) උපදේශක කාර්ය මණ්ඩලය අතුරින් තැනැත්තන් තිදෙනෙක් : එසේ වුවද, එක් විශේෂඥ අංශයකින් එක් තැනැත්තකුට වැඩියෙන් නොසිටිය යුතු ය ;

(iii) ආරෝග්‍යශාලාවේ ප්‍රධාන හෙදි පාලිකාව ;

(iv) ආරෝග්‍යශාලාවේ ලේකම්වරයා හෝ ආරෝග්‍යශාලාවේ ප්‍රධාන පරිපාලන නිලධරයා ; සහ

(v) ආරෝග්‍යශාලාවේ ප්‍රධාන ගණකාධිකාරිවරයා.

(4) ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂවරයා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.

(5) කළමනාකරණ කමිටුවේ කවර හෝ රැස්වීමකට සහභාගිවීමට මණ්ඩලයේ සභාපතිවරයාට හිමිකම තිබිය යුතු ය.

(6) එම කමිටු රැස්වීම් සඳහා වූ ගණපූරණය සහ එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කළමනාකරණ කමිටුව විසින් තීරණය කළ යුතු ය.

9. මණ්ඩලය විසින්, ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටුකිරීම සහ කර්තව්‍ය කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත නිකුත් කළ හැකි අතර මණ්ඩලය විසින් එකී විධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය. අමාත්‍යවරයාගේ විධාන.

10. (1) මණ්ඩලයට මණ්ඩලයේම අරමුදලක් තිබිය යුතු අතර, එය මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය. මණ්ඩලයේ අරමුදල.

(2) (අ) මුදලින් ලැබෙන ත්‍යාග හෝ පරිත්‍යාග;

(ආ) ආණ්ඩුවෙන් ලැබෙන්නා වූ යම් ප්‍රදානයක්;

(ඇ) උපපාදනයන්ගෙන් ලැබෙන ආදායම්; සහ

(ඈ) කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන මණ්ඩලය සතු වූ අනෙකුත් සියලු මුදල්

මණ්ඩලයේ අරමුදලට ගෙවිය යුතු ය.

(3) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු ය.

(4) මණ්ඩලයේ අරමුදල පරිපාලනය කිරීම සම්බන්ධව මණ්ඩලය වගකීම් දැරිය යුතු ය.

11. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට අවශ්‍ය වන්නා වූ හෝ බලය පැවරී ඇති හෝ කරුණු සම්බන්ධයෙන් ද විශේෂයෙන් ම පහත දැක්වෙන සියලු කරුණු හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:— නියෝග.

(අ) (i) සේවක පිරිසට අදාළව ආරෝග්‍යශාලාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා අලුත් ගොඩනැගිලි හා උපකරණ සැපයීම පිළිබඳව ද යම් නිශ්චිත රෝගයකින් පෙළෙන රෝගීන් ආරෝග්‍යශාලාවට ඇතුළත් කර ගැනීම හෝ ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිබඳව ද නිර්දේශ කිරීම ඇතුළුව, ආරෝග්‍යශාලාව විසින් සලසනු ලබන සේවාවන්හි ප්‍රමාණවත් භාවය හා කාර්යක්ෂමතාව;

(ii) වෛද්‍ය පිරිස පුහුණු කිරීමෙහි ලා උසස් ශාස්ත්‍රීය තත්ත්වයක් ස්ථාපනය කිරීම සහ පවත්වා ගෙන යාම;

(iii) පාඨමාලා සැපයීම සහ පර්යේෂණ ව්‍යාපෘති පිහිටුවීම සහ ඒ කාර්ය සඳහා උචිත උපදේශක කමිටුව විසින් නිර්ණය කරනු ලබන ආකාරයකට හා කාර්යයන්ට ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙහි නොවන වෙනත් ආරෝග්‍යශාලා හෝ ආයතන හෝ සමග සහයෝගිවීම;

(iv) අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා උපදේශක කමිටුව වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණු පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම සඳහා උපදේශක කමිටු පිහිටුවීම ;

(ආ) උපදේශක කමිටුවල සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ;

(ඇ) ආරෝග්‍යශාලාව තුළට, ආරෝග්‍යශාලාවේ සේවා නියුක්ත යන් සඳහා සපයා ඇති වාසස්ථාන තුළට සහ සේවා ප්‍රදේශය තුළට තැනැත්තන් ඇතුළුවීම හෝ ප්‍රවේශවීම සීමා කිරීම සහ එසේ ඇතුළුවන තැනැත්තන්ගේ පැවැත්ම විධිමත් කිරීම.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "ආරෝග්‍යශාලාවේ දේපළ" යන්නට සේවා නියුක්තයන් විසින් පරිහරණය කරනු ලබන ආරෝග්‍යශාලාවේ දේපළ සහ ආණ්ඩුවේ සහ පෞද්ගලික සංවිධාන වලට බදු දෙන ලද හෝ කුලියට දෙන ලද හෝ ආරෝග්‍යශාලාවේ දේපළ ඇතුළත් වේ.

මුදල් වර්ෂය සහ මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම.

12. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලයේ ආදායම සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සෙසු සියලු ගනුදෙනු පිළිබඳව, මණ්ඩලය විසින්, නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වැරදි.

13. ආරෝග්‍යශාලා භූමිය තුළ—

(අ) අසභ්‍ය, අවිනීත හෝ පීඩාකාරී භාෂාව පාවිච්චි කරන හෝ එබඳු අංගහාර කරන හෝ යම් තැනැත්තකුට පීඩා විය හැකි හෝ නින්දා විය හැකි ආකාරයට හැසිරෙන ;

(ආ) ආරෝග්‍යශාලා දේපළ මත කෙළ ගසන හෝ එම දේපළෙහි යම් කොටසක් වුවමනාවෙන්ම අපවිත්‍ර කරන ;

(ඇ) ආරෝග්‍යශාලා භූමියෙහි දුම්පානය කිරීම තහනම් බවට දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබෙන යම් කොටසක දුම්පානය කරන හෝ දල්වන ලද පයිප්පයක්, සුරුට්ටුවක්, සිගරැට්ටුවක් හෝ දුම්පානය සඳහා වූ ද්‍රව්‍යයක් රැගෙන යන ;

(ඈ) තැනැත්තන්ට පීඩා සිදුවීමට හෝ, යම් තැනැත්තකුට හෝ දේපළකට අලාභ හෝ හානි සිදුවීමට ඉඩ තිබෙන යම් බෝතලයක්, ද්‍රවයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් ආරෝග්‍ය ශාලාවේ ජනේලවලින් පිටතට විසි කරන ;

(ඉ) ආරෝග්‍යශාලා භූමියෙහි වාහන නතර කිරීම තහනම් බවට දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබෙන යම් කොටසක වාහන යක් නතර කරන ; හෝ

(ඊ) යම් පැලෑටියකට හානි කරන නැතහොත් පැලෑටියක් විනාශ කරන හෝ ආරෝග්‍යශාලා භූමියෙන් යම් පැලෑටියක් රැගෙන යන හෝ ඉවත් කරන

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආරෝග්‍යශාලා භූමිය" යන්නට ආරෝග්‍යශාලාවේ සේවා නියුක්තයන් සඳහා සපයා ඇති වාසස්ථාන මෙන් ම සේවා ප්‍රදේශ ද ඇතුළත් වේ.

**රජයේ නිලධරයන් සහ පළාත් පාලක සේවයේ සාමාජිකයන් මණ්ඩලයට පත් කිරීම.**

14. (1) රජයේ සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද ඒ නිලධරයා සේවයේ නියුතු හෝ අනුයුක්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ ද කැමැත්ත ඇතිව සහ මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ රජයේ සේවයේ යම් නිලධරයකුට හා නිලධරයකු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ රජයේ සේවයේ යම් නිලධරයකුට හා නිලධරයකු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලය සඳහා සේවය කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, ඔහු විසින් ආණ්ඩුවට සේවය කරනු ලබන සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට මණ්ඩලය විසින්, එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය එකඟ

වන, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම් ඇතුළු අදාළ නියම හා කොන්දේසි මත ඒ සාමාජිකයා, ඒ නිලධරයා හෝ සේවකයා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන්, එහි නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

**15.** (1) මේ පනතේ කාර්ය සඳහා පත් කරන ලද, මණ්ඩලයේ යම් සාමාජිකයකු, යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින්, මණ්ඩලයේ විධානය මත හෝ මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. තව ද එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය වෙත ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු මණ්ඩලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ තමා විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි තමාට විරුද්ධව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක්, එය සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් ලෙස අධිකරණය තීරණය කරත හොත් සහ ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කරගෙන නොමැත හොත් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ සාමාජිකයකුගේ දේපලට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**16.** මණ්ඩලයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ මණ්ඩලයේ යම් නිලධරයකුට නැතහොත් සේවකයකුට විරුද්ධව හෝ එවැනි තැනැත්තකුගේ දේපලට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**17.** මණ්ඩලයේ සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

18. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව අර්ථ නිරූපණය කර ගත යුතු ය. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්—

(අ) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යටතේ පිහිටුවන ලද යම් සංවර්ධන සභාවක් හෝ, පිළිවෙළින් මහා නගර සභා ආඥාපනත යටතේ, නගර සභා ආඥාපනත යටතේ, සුළු නගර සභා ආඥාපනත යටතේ හා ගම් සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හා ගම් සභාවක් සතු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පවරා දෙමින් යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරයක්, පුද්ගල මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වේ;

(ආ) යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ද ඊට ඇතුළත් වේ;

"සේවා ප්‍රදේශ" යන්නෙන්, ආරෝග්‍යශාලාවට පැමිණෙන රෝගීන්ට සහ ආගන්තුකයින්ට පහසුකම් සැලසීමේ කාර්ය සඳහා ආණ්ඩුවේ හෝ පෞද්ගලික හෝ සංවිධානවලට බදු දෙන ලද නැතහොත් කුලියට දෙන ලද ආරෝග්‍යශාලාවේ දේපළ අදහස් වේ.